**ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 28 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා ගිණුම් ශේෂය රු.115,320 කින් වැඩියෙන් දැක්වුණි.

(ආ) රු.70,000 ක් වූ ප්‍රොජෙක්ටරයේ වටිනාකම පොදු ගබඩා සහ යන්ත්‍රෝපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ඉඩමක් අත්පත් කර ගැනීම වෙනුවෙන් වූ තැන්පත් මුදල හා ඊට අදාළ පොලිය යන දෙකේ එකතුව වූ රු.5,888,563 කින් පොලී වෙනම හඳුනාගෙන ගිණුම්ගත කරනවා වෙනුවට මුළු මුදලම වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාළ පිරිවැය රු.3,942,222 ක් වූ ඉදිකිරීම් ප්‍රාග්ධන ගතකර නොතිබුණි.

(ඉ) සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් හා ගොඩනැගිලි 24 ක වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) පොදු ගිණුමෙන් කර්මාන්ත ගිණුමට මාරු කරන ලද රු.3,771,767 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 05 කට අදාළ හිඟ ආදායම් හා ප්‍රා.ස 07 ආකෘතියේ එදිනට පැවති හිඟ ආදායම් අතර රු.2,558,048 ක වෙනසක් පැවතුණි.

(ආ) ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආධාර මගින් දායකවීමේ ගිණුමේ ශේෂය, ස්ථාවර වත්කම් වටිනාකමට සමාන විය යුතු වුවත් රු.983,387 ක වෙනසක් පැවතුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.154,163,881 ක් විය. 2018 ජූනි 01 දින වනවිට තවදුරටත් අයවිය යුතු ශේෂය රු.98,908,804 ක් වූ අතර, ඒ තුළ 2013, 2014 හා 2015 වර්ෂවලට අදාළව අයවිය යුතු රු.4,444,778 ක කර්මාන්ත ණයගැති ශේෂයක් විය.

(ආ) ගෙවියයුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.73,819,862 ක් වූ අතර ඉන් රඳවා ගතයුතු තැන්පත් හැර අනෙකුත් තැන්පත් නිරවුල් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම**

**<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.181,250,876 ක් වූ ගිණුම් විෂයයන් 12 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| (I) 193 රීතිය | - | එක් එක් ආදායම් හා වියදම් විෂයය යටතේ වන අතිරික්තයන් හා ඉතිරි වීම් පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (II) 206 රීතිය | - | සමීක්ෂණ මණ්ඩල වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (III) 218 රීතිය | - | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණ කටයුතු සිදු කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 571 | 1,875,855 | වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

(ඇ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

4.2 මාර්ගෝපදේශය - සභාව විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.85,900,111 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,131,517 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 11,846 | 6,304 | 4,669 | 5,542 | 5,694 | 6,351 | 2,955 | 6,219 |
| (ii) | බදු කුලී | 19,183 | 16,141 | 11,332 | 3,042 | 13,690 | 13,105 | 11,443 | 4,667 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,005 | 2,005 | 2,005 | - | 2,100 | 2,054 | 898 | 70 |
| (iv) | වෙනත් ආදායම් | 286,905 | 173,150 | 122,290 | 113,755 | 108,815 | 108,225 | 73,041 | 59,666 |
| එකතුව | | 319,939 | 197,600 | 140,296 | 122,339 | 130,299 | 129,735 | 88,337 | 70,622 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයේ බිල්කළ ආදායම වූ රුපියල් මිලියන 197 කින් , රුපියල් මිලියන 140 ක් රැස්කර තිබූ අතර, එයින් රුපියල් මිලියන 67 ක් ඉකුත් වර්ෂයන්ට අදාළව විය. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රුපියල් මිලියන 70 ක් වූ හිඟ ආදායම් සමාලෝචිත වර්ෂයේදී රුපියල් මිලියන 122 ක් දක්වා වැඩි වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,969,987 ක් වූ වරිපනම් හිඟය ප්‍රාදේශීය සභා පනතේ විධි විධාන ප්‍රකාරව අය කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් අයවීමේ මන්දගාමී තත්ත්වයක් නිරීක්ෂණය විය.

(ආ) ප්‍රාදේශීය සභා සීමාව තුළ වූ නව සංවර්ධිත ප්‍රදේශ හඳුනා ගෙන ගැසට් කිරීම වර්ෂ 30 පමණ කාලයක සිට සිදුකර නොතිබුණි.

### 2.2.4 බදුකුලී හා කඩකුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදුකුලී හා කඩකුලී රු.3,043,361 ක් වූ අතර, එයින් රු.2,903,261 ක් වර්ෂයකට වැඩි කාලයක සිට අයවිය යුතු ශේෂයක් විය.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.5,029,205 ක් සහ රු.90,000,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී මුද්දර ගාස්තු කිසිවක් සභාවට ලැබී නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය,

පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට අනු කරුණු ද ඇතුළත්ව කාරණා 51 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

-----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට යෝජිත සංවර්ධන වැඩ යෝජනා 83 ක වටිනාකම රු. 56,175,968 ක් වූ නමුත් එයින් රු. 26,500,000 ක් වූ වැඩ හා යෝජනා 66 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා 2017 මැයි 16 දින රුපියල් මිලියන 6 ක් වැයකර ඉඩමක් මිලදී ගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එහි ඉදිකිරීම් කටයුතු සැලසුම් කර නොතිබූ අතර දිරන කසළ පෞද්ගලික ඉඩම්වල වලවල් කපා බැහැර කිරීම සිදුකරමින් පැවතුණි.

(ඈ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2015-2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව තිබුණත් දිළිඳුකම තුරන් කිරීම, කුසගින්න තුරන් කිරීම , ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම, පෝෂණය වර්ධනය කිරීම හා සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම යන අරමුණු පෙරදැරිව හුදකලා ගම්මාන සංවර්ධන වැඩසටහන් යටතේ ව්‍යාපෘති 07 ක් ක්‍රියාත්මක කර තිබුණි.මීට අමතරව සෞඛ්‍ය වැඩසටහන් යටතේ ඩෙංගු රෝගය අවම කිරීම සඳහා ශ්‍රමදාන හා සතියකට වරක් බෝවන රෝග සම්බන්ධව රැස්වීම් පැවැත්වීම වැනි කටයුතු සිදුකර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බලප්‍රදේශය තුළ පවතින සුසාන භූමි 126 කින් 124 ක් සභාවට පවරාගෙන නොතිබුණි. 2017 වර්ෂයේ අයවැය ලේඛනයේ සුසාන භූමි නවීකරණය කිරීම සඳහා රු.500,000 ක ප්‍රතිපාදන තිබුණද, එමඟින් කිසිදු නවීකරණ කටයුත්තක් සිදුකර නොතිබුණි. සුසාන භූමි 74 ක වැටවල් ගසා හඳුනාගත හැකි පරිදි වෙන්කර නොතිබුණි.

(ආ) මැල්සිරිපුර සතිපොළෙහි සියළු ගොඩනැගිලි භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්වී තිබුණද අවශ්‍ය අළුත්වැඩියා කටයුතු කිරීම පිළිබඳව සභාවේ අවධානය යොමු වී නොතිබීම හේතුවෙන් මහජනතාවගේ හා වෙළඳුන්ගේ ජීවිත ආරක්ෂාවට ගැටළු මතු වී තිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**---------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලයේ තෘතීයික, ද්විතීක හා ප්‍රාථමික තනතුරුවලට අදාළව පුරප්පාඩු 28 ක් හා ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවලට අදාළව අතිරික්ත 36 ක් පැවතුණි. අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සංවර්ධන නිලධාරීන් 27 ක් අනුයුක්ත කර තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ට අනුකූලව ස්ථිර කරන ලද සේවකයින් 25 දෙනෙකුගෙන් 09 ක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නොතිබුණි.

(ඇ) උක්ත චක්‍රලේඛය ප්‍රකාරව බඳවා ගන්නා ලද සේවකයින් තිදෙනෙකුට තනතුරට අදාළ රාජකාරි නොපවරා කාර්යාලගත රාජකාරි පවරා තිබුණි.

(ඈ) වැඩ තහනම් වීම මත සේවය අවසන් කළ නිලධාරියෙකුගෙන් ලැබිය යුතු රු.126,769 ක ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 නිශ්ක්‍රීය වත්කම්**

-----------------

ඡායා පිටපත් යන්ත්‍රයක් සහ ලේසර් ප්‍රින්ටරයක් වසර 05 ක පමණ සිට අභාවිතව පැවතුණි.

**3.5 ප්‍රසම්පාදනය**

---------------

**3.5.1 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.1,752,434 ක වියදමින් හුබුළුගල ආරණ්‍ය සේනාසන මාර්ගයේ පෙර නිමි කුට්ටිගල් අල්ලා තිබුණද, ස්ථාන කිහිපයක කුට්ටිගල් ගිලා බැස තිබුණි. තවද, යොදා තිබුණු කොන්ක්‍රීට් වැටිය මාර්ගයේ වංගු සහිත ස්ථානවලදී පිපිරීමට හා තල්ලුවීමට භාජනය වී තිබුණි. කොන්ක්‍රීට් වැටිය යෙදීමේදී මාර්ගය මට්ටම් වන සේ දෙපසින් එකම මට්ටමට ඉදිකර නොතිබුණු අතර කොන්ක්‍රීට් වැටිය සමහර ස්ථානවල කුට්ටිගල්වලට පහළින්ද සමහර ස්ථානවල ඉහළින්ද පැවතුණි.

(ආ) රු. 548,795 ක වියදමින් තිත්තවැල්ල විදුහල අසල මාර්ගයට කොන්ක්‍රීට් කුට්ටිගල් ඇල්ලීමේදී මාර්ගය ආරම්භක ස්ථානයේ ඉදිකර තිබුණු දිග අඩි 17.6 ක් හා පළල අඟල් 6 ක් වූ කොන්ක්‍රීට් වැටිය ස්ථාන 06 කින් පුපුරා තිබුණි.

(ඇ) වයඹ සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන 2017 යටතේ රු.2,000,000 ඇස්තමේන්තුවකට හුබුළුගල ආරණ්‍ය සේනාසන පාර කොන්ක්‍රීට් කිරීමේදී කොන්ක්‍රීට් තට්ටුවේ ඝණකම අඟල් 6 ක් තිබිය යුතු වුවත්, මාර්ගයේ මැද කොටසේ ඝණකම අඟල් 5 ක් විය. තවද කොන්ක්‍රීට් සඳහා ගෙන එන ලද වැලි ඒ සඳහා යෝග්‍ය නොවන මඩ සහිත සෝදන ලද වැලි බව 2017 අගෝස්තු 28 දින සිදුකළ භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඈ) නිමි වැඩ වටිනාකම රු.4,323,983 ක් වූ මීටර් 650 ක් දිගින් හා මීටර් 3 ක් පළලින් යුත් ගනේවත්ත නැලව ශ්‍රී ජය මාවත පාර අළුත්ගම පාර දක්වා කොන්ක්‍රීට් කර මාසයක් ගතවීමේදී මාර්ගයේ යෙදූ ගල් හා වැලි මතුවෙමින් සම්පූර්ණයෙන්ම ගැලවෙමින් පැවති අතර කොන්ක්‍රීට් තට්ටුව කඩා පරීක්ෂා කිරීමේදී ඉතා පහසුවෙන් කැඩී වෙන්වෙන බව 2017 සැප්තැම්බර් සිදුකළ භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(ඉ) 2012 වර්ෂයේ වැඩ ආරම්භ කර දැනට ක්‍රියාත්මක තත්ත්වයේ පවතින නා බැට ජල ව්‍යාපෘතිය සඳහා 2013 වර්ෂයේ සභා අරමුදල් මගින් ජල ටැංකියක් ඉදි කිරීම සඳහා රු.1,336,545 ක් වැයකර තිබුණි. ජල ටැංකියේ පතුලින් නිරන්තරයෙන් ජලය වහනය වන තත්ත්වය 2015 නොවැම්බර් හා 2017 සැප්තැම්බර් සිදුකළ භෞතික පරීක්ෂාවන්ට අනුව තහවුරු විය.

(ඊ) 2014 වර්ෂයේදී රු.164,816 ක් වැයකර ඉදිකර තිබුණු හිරිපිටිය උප කාර්යාලයේ වාහන නවතා තැබීමේ ගරාජයේ ඉදි කිරීම්වල පවතින අඩුපාඩු සමාලෝචිත වර්ෂය තුළද සකස් කර නොතිබුණු අතර අදාළ ඉදිකිරීම ගරා වැටෙමින් පැවතුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

2017 අගෝස්තු 14 දින වන විට ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටුකළ ව්‍යාපෘතිවල ප්‍රගති වාර්තා අනුව අයවැය ලේඛනයට ඇතුළත් නොවූ රු.7,963,037 ක් වූ ව්‍යාපෘති 12 ක්ම ප්‍රධාන කාර්යාල ඉදිකිරීම් සඳහා වැයකර තිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) ස්ථාවර වත්කම් අඩුවෙන් ගිණුම්ගත කිරීම. |
| | (ii) ප්‍රාග්ධන වියදම් |
| | (iii) ගබඩා ද්‍රව්‍ය පිරිවැය වැරදි ලෙස සටහන් කිරීම. |
| | (iv) වර්ෂයේ ආදායම් හඳුනා නොගැනීම. |
| (ආ) ආදායම් | (i) හිඟ ආදායම් අයකර ගැනීමේ දුර්වලතා පැවතීම. |
| | (ii) දේපල තක්සේරු නොකිරීම. |
| | (iii) වරිපනම් ප්‍රදේශ හඳුනාගෙන ගැසට් කිරීමට කටයුතු නොකිරීම. |
| (ඇ) ස්ථාවර වත්කම් | (i) ස්ථාවර වත්කම් ලේඛන පවත්වා නොගැනීම. |
| | (ii) නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම් පැවතීම. |
| | (iii) වත්කම්වල අයිතිය පවරා ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | (i) මාර්ග ඉදි කිරීම් ප්‍රමිතියකින් තොරවීම. |
| | (ii) ගොඩනැගිලි අළුත්වැඩියාවන් ප්‍රමිතියකින් තොරවීම. |